# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022
2024 ඔක්තෝබර් / නොවැම්බර්

සමාජීය විද්‍යා පීඨය

සමාජ විද්‍යාව (නව නිර්දේශය)

ප්‍රායෝගික සමාජ විද්‍යාව - **SOCI 18224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. යම්කිසි රටක ඇතිවන සමාජීය ප්‍රශ්න හඳුනාගැනීමට හා විසඳුම් ප්‍රවේශ තීරණය කිරීමේදී ප්‍රායෝගික සමාජ විද්‍යාඥයින්ගේ කාර්යභාරය විස්තර කරන්න.

02. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කෙටි හැඳින්වීමක් කර කාන්තාවන්ට එරෙහි ගෘහස්ත ප්‍රචණ්ඩත්වයේ අවදානම් සහගත බව ඒ ආශ්‍රිත සාධක හා ප්‍රවනතා ඇසුරින් පෙන්වන්න.

03. මත්ද්‍රව්‍ය ඇබ්බැහිය පුද්ගල පවුල් සබඳතා ආශ්‍රිත ගැටලු ඇතිවීමට බලපාන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

04. ජනගහනය ආශ්‍රිත මූලික සංකල්ප හා දර්ශක ඇසුරින් ලෝක ජනගහන ප්‍රවනතා විස්තර කරන්න.

05. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ සමාජ ආරක්ෂණ හා සුබසාධන වැඩසටහන් විස්තර කර එහි ප්‍රතිඵල විග්‍රහ කරන්න.

06. දුගීභාවය අධ්‍යයනය කළහැකි න්‍යායාත්මක ආකෘති මොනවාදැයි පැහැදිලි කර දුගීභාවයේ නව ප්‍රවනතා විස්තර කරන්න.

07. වාර්ගිකත්වය ආශ්‍රිත සමාජ විද්‍යාත්මක සංකල්ප විස්තර කර ලෝක වාර්ගික ගැටලුවල නව මුහුණුවර පැහැදිලි කරන්න.

08. තෝරාගත් මාතෘකා දෙකකට (02) පමණක් සටහන් ලියන්න.

    i. සමාජ සංචලතාව
    ii. සමාජ වියනුකලනය හා අනෝමියත්වය
    iii. ශ්‍රී ලංකාවේ ජන සංක්‍රමණික රටාවන්
    iv. තිරස් සහ සිරස් නාගරීකරණය

********************************